ළමා අධ්‍යාපනය

# විශිෂ්ටත්වය දැක්වීමට ඔබේ දරුවාට උදව්වෙන්න

**පාසල් යන දරුවන් සිටින දෙමව්පියන්ගේ ප්‍රයෝජනය සඳහා උසස් විදුහලක අවුරුදු 18 ක කාලයක් ගුරුවරයකු වශයෙන් සේවය කළ පොත් කිහිපයක් ද පළ කොට ඇති කතුවරයකුගේ අදහස් හා යෝජනා ද ඇතුළත් ලිපියකි.**

එර්ජිනියාවෙහි, ඇලෙක්සැන්ඩ්‍රියාවේ උසස් පාසලක දහඅට වසරක් උගන්වා ඇති පැට්‍රික් වෙල්ෂ් පාසලෙන් පිටත කතා (Tales out of School) නැමැති කෘතියේ කතුවරයා ය. ඔබේ පුතා හෝ දුව ලබන අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කළ හැකි බව ඔහු පවසයි. එය කළ හැක්කේ කෙසේදැයි මෙසේ පැහැදිලි කරයි.

මා ගුරුවරයකු වශයෙන් සේවය කරද්දී පාසල් දරුවන්ගේ දෙමව්පියන් හමුවිය යුතු වුවත් ඔවුන්ට සවන් නොදිය යුතු යැයි මම සිතුවෙමි. එහෙත් දැනට මට දරුවන් තිදෙනකු සිටින බැවින් මා තුළ තිබූ එකී ආකල්පය දැන් වෙනස් වී ඇත. මතු දැක්වෙන පියවර අනුගමනය කිරීමට දෙමව්පියන් උනන්දුවක් දක්වතොත් ඔවුන්ගේ දරුවන්ට පාසලෙන් ලබා ගත හැකි දේවල අතිවිශාල වෙනසක් ඇති කිරීමට ඔවුනට හැකි වනවා ඇත.

**1 ඔබේ දරුවනට ගුරුවරුන් අතුරින් හොඳම අය ලැබෙන බවට වග බලා ගන්න.**

හැම පාසල් පද්ධතියකම සමීප වීමට ඉතාමත් අපහසු දරුවන් පවා උනන්දු කිරීමෙහි සමත් නිර්මාණශීලී දක්ෂතම ගුරුවරු සිටින්නාහ. ඔවුන් සොයා දැන ගැනීම අපහසු නැත.

ඔබ කැමති ගුරුවරයා හෝ ගුරුවරිය හඳුනා ගත් පසු ඔබේ ඉල්ලීම ඉදිරිපත් කරන්න. ඒ අතරම වැඩිපුර කතාබහ නොකරන දෙමව්පියන්ගේ දරුවන් දුර්වල ගුරුවර, ගුරුවරියන්ට පැවරීමෙන් පරිපාලකයින් බාගවෙලාවට අධිවේගී ක්‍රියා මාර්ගයක් අනුගමනය කරන බව අමතක නොකරන්න.



ඔබේ පොඩි දරුවාට නිතරම ඉතාමත් ප්‍රියමනාප ගුරුවරුන් නොලැබෙන්නට පුළුවන. එවිට තම දරුවා වෙනත් පංතියකට මාරුකරවා ගැනීමට නොහැකි වුවහොත් ගුරුවරයා හෝ ගුරුවරිය ගැන නොතකා විෂයය ගැන හිත යොමු කරවීමට පුතා හෝ දුව හෝ උනන්දු කරවන්න. මොනවා වුවත් ඉගෙන ගැනීම මූලික වශයෙන් දරුවා සතු කාර්යයකි.

**2 ඔබත් ඔබේ පොඩි දරුවනුත් දැන හඳුනා ගැනීමට ගුරුවරුනට උදව් වෙන්න.**

අද කාලයේ එක් ගුරුවරයකුට හෝ ගුරුවරියකට හෝ අති විශාල ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටින ලොකු පාසල්වල සමහර පොඩිත්තන් නම් ලැයිස්තුවට පමණක් සීමාවුවත් වීමට පුළුවන.

එසේ හෙයින් ගුරුවරුන් දැන හඳුනා ගැනීමෙන් තම දරුවන් එම නිර්නාමික බවින් මුදවා ගැනීමට දෙමව්පියන්ට හැකි වේ. දරුවකු මවගේ හෝ පියාගේ හෝ මුහුණට සම්බන්ධ කොට සිතීමට ගුරුවරයාට හෝ ගුරුවරියට හැකි වූ විට එම දරුවා පවුලේ කෙනෙකු මෙන් ඔවුනට හැඟෙනු ඇත.

ඔබේ දරුවාගේ පාසලේ වැඩකටයුතුවලට බලපාන ප්‍රශ්න වෙතොත් ගුරුවරයා හෝ ගුරුවරිය හෝ සමග කතාබහ කරන්න. සමහරවිට වැරදි අවබෝධයක් හේතුකොට පාසල් වැඩ අතපසු කරන එසේ නැත්නම් අනිසි අන්දමට හැසිරෙන ළමුන් අත්හැර දැමීම ගුරුවරුනට පහසු දෙයක් වනු ඇත.

එක් මවක් ඇගේ දරුවා පිළිබඳව මා සමග කතා කිරීමට සුදුසු වේලාවක් යොදා ගත්තා ය. ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයකු වූ ඒ ළමයා අඩි හයකුත් අඟල් හතරක් උස ය. රාත්තල් 240 ක් බර ය. ඔහු ඉංග්‍රීසි පංතියේ බුම්මාගත් ගමන් මා දෙස බලාගෙන සිටියේ මා පමණක් නොව මා පැවසූ හැම දෙයක් ම පිළිකුල් කරන්නාක් මෙන් ය. මව මා සමග කතා කරද්දී ඇයගේ පුතා පංතියේ වැඩවලට හවුල් වීමට මහත් බියකින් පසුවන බවක් මට දක්නට ලැබිණි. එයට හේතුව පංතියේ අනෙක් ළමුන් විශේෂයෙන් ම ගැහැනු ළමයින් සාහිත්‍ය ගැන ඔහුට වඩා දැන සිටි බව පෙනුණු නිසා ය. ඔහුගේ එම ලැජ්ජාශීලී බව 'වෛරයක්' ලෙස මා වරදවා වටහා ගෙන තිබුණි.

ඔහුගේ මවත් මාත් කතා කොට අවසන් වූ පසු අපි එක්ව වැඩ කිරීමට එකඟ වීමු. පංතියේ දී වැඩිපුර කතාබහ කිරීමට ඔහු ඉදිරිපත් විය යුතු යයි මව ඔහුට පවසන අතර මම ද වැඩිපුර ඔහු ඇමතීමට ඉටා ගතිමි. ගතවූයේ සති දෙකකි. පංතියේ දී ඔහු අමතා ඔහු දැක්වූ ප්‍රතිචාරය මම වර්ණනා කළෙමි. බුම්මාගෙන සිටි ගතිය ඉක්මනින් ම අතුරුදහන් ව ඇති බව පෙනෙන්නට තිබුණි. ඔහුගේ ලිවීමේ ශක්තිය ද වර්ධනයවී ඇති බව දක්නට ලැබුණි. ඉන්පසු මගේ හොඳම ශිෂ්‍යයින්ගෙන් කෙනෙකු බවට ඔහු පත්වුණි.

එහි රහස මෙය යි. පුතාගේ හෝ දියණියගේ ශුභ සිද්ධිය තකා මව හෝ පියාත් ගුරුවරයා හෝ ගුරුවරියත් එක්ව සහයෝගයෙන් කටයුතු කරන විට ආශ්චර්යවත් දෑ සිදුවිය හැකි බව මගේ විශ්වාසය යි.

**3. යථාර්ථවාදී වෙන්න.** ගුරුවරුන් වන අප දෙමව්පියන් මග හැරීමට එක් හේතුවක් නම් අප නැඹුරු වී සිටින්නේ ඔවුන්ගේ දරුවකුට හිමිවිය යුතු දඬුවමකට එරෙහිව විරුද්ධත්වය ප්‍රකාශ කිරීමට හෝ එසේ නැත්නම් දරුවා ඉහළ ශ්‍රේණියකට උසස් කරවා ගැනීමට හෝ කරන කතාබහට සවන්දීමට ය.

සමහර දෙමව්පියන් මෙසේ තර්ක කළ අවස්ථා ඇත. "මගේ ළමයාට 'සී' එකක් දුන්නොත් එහෙම ඔහු ඇයදුම් කොට තිබෙන විද්‍යාලයයකට යන්න ලැබෙන්නේ නැහැ". තම දරුවා හොඳින් වැඩ කර නොමැති බව හෝ ඉහළ ශ්‍රේණියක් ලබා ගැනීමට හැකියාවක් නොමැති බව හෝ ඔවුන් පිළිගන්නේ නැත.

**4. හොඳ ශිෂ්‍යයින්ට කෘතඥ වෙන්න**

අපේ වෘත්තීය ජීවිතයේ වැඩි කාලයක් ගෙවී යන්නේ පංතියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සමග ය. 44 පිටුවට

# විශිෂ්ටත්වය...

42 පිටුවෙන්

එහෙත් ඒ වෙනුවෙන් බොහෝ වැඩිහිටියන්ගෙන් ලැබෙන පිළිගැනීම් ප්‍රතිචාරය ඉතා අල්ප ය. ඔවුන්ගේ දූ දරුවන්ගේ ජීවිත හැඩගැස්වීමෙහිලා අපෙන් සිදුවෙන සේවය ගැන අසන්නට ලැබෙන්නේ බොහොමත් ම කලාතුරකිනි.

මෙහිදී දුරකතන පණිවුඩයක් මගින් හෝ ලියුම් කැබැල්ලකින් ලැබෙන දිරිගැන්වීම සුළුපටු නොවේ. එමගින් අති විශිෂ්ට ප්‍රතිඵල ලැබෙන්නට පුළුවන. ඔබේ දරුවා කෙරෙහි විශේෂ සැලකිල්ලක් දැක්වීමට එයින් පෙළඹෙනු ඇත.

**5. අනෙක් දෙමව්පියනුත් දැන හැඳින ගන්න.**

උදාහරණයක් ලෙස කිවහොත් යම් ගුරුවරියක හෝ ගුරුවරයකු හෝ සතු වගකීම් කොටස හරි හැටි ඉටු නොවේය යන සැකයක් ඔබට ඇතොත් පංතියේ අනෙක් ළමුන්ගේ දෙමව්පියන් එයට එකඟ වෙතවාදැයි විපරම් කර බලන්න. අතිශය වැදගත් කාරණයක් සම්බන්ධයෙන් ඔබට පාසල් බලධාරියකු සමග කතාබහ කිරීමට අවශ්‍ය වෙතොත් තවත් පිරිසක් ඔබ පිටුපස සිටින් නම් එය ඔබට බලවත් රුකුලක් වනු නිසැක ය.

**6. ඔබේ දරුවන් කෙරෙහි අවධානය යොමු කරන්න:**

තම දරුවන් උසස් පාසල්වලට ඇතුළත් වූ පසු දෙමව්පියන්ගේ සහභාගිත්වය ක්‍රමයෙන් හීනවෙන බව අපේ විදුහල්පතිතුමා පෙන්වා දෙයි. 'ප්‍රාථමික පාසල්වල දරුවන් කෙරෙහි මෙන් ම උසස් පාසල්වල දරුවන් කෙරෙහි දැඩි අවධානයක් ඇතැම්විට ඊටත් වැඩි අවධානයක් යොමු කළ යුතු බව දෙමව්පියෝ අවබෝධ කර නොගනිති' යයි හෙතෙම වැඩිදුරටත් පවසයි.

අනෙක් කාරණය නම් තම දූ දරුවන් සමග වැඩි කාලවේලාවක් ගත නොකරන දෙමව්පියන් බොහෝවිට අවසානයේ කරන්නේ තම පොඩිත්තන්ට දැනුම කාවැද්දීම සඳහා ක්ෂණික මගක් සූදනම් කිරීමයි. විශ්ව විද්‍යාලයකට හෝ වෙනත් උසස් විදුහලකට හෝ ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයක් වෙනුවෙන් අවුරුදු ගණනාවක් තිස්සේ සිදු වූ අතපසුවීම් කෙටිකාලීන පාඨමාලාවකින් සම්පූර්ණ කර ගත හැකි යයි ඇතැම් දෙමව්පියෝ කල්පනා කරති. එවැනි දෙමව්පියන්ගෙන් බොහෝ දෙනෙක් පොත පත කියවන්නේ ද මඳ වශයෙනි. අධ්‍යාපනික කටයුතුවල වර්ධනය කෙරෙහි බලපාන එක් දෙයක් ගැන මට සහතික යි. එනම් දරුවකුට ඔහුගේ කාමරය තුළ රූපවාහිනිය තබා ගැනීමට කිසිවිටෙක ඉඩ නොතබන්න.

**7. ඔබේ දරුවාගේ ජයග්‍රහණයන්හිදී ප්‍රීති උත්සව පවත්වන්න:**

දෙමව්පියෝ මෙන් ම ගුරුවරයෝ ද දරුවන් ගේ ශාස්ත්‍රීය හැකියාවන් කෙරෙහි නුවුමනා සේ වැඩි සැලකිල්ලක් දක්වති. සමහරවිට මිනිසුන් වශයෙන් දරුවන්ගේ වැඩි අගය කේන්ද්‍රීය ගත කිරීමට අප නැඹුරු වෙන්නේ ඔවුන් ගේ ශ්‍රේණී අනුව ය. එහෙත් සියලුම දරුවන්ට ශාස්ත්‍රීය අංශයෙන් බැබළීමට නොහැකි බව අපට මෙහිදී අමතක වෙයි. ඔබේ දරුවාගේ ආත්ම විශ්වාසය උපදවන ආකාරයේ ජයග්‍රහණයක් සිය අත්දැකීම් තුළින්ම ලබා ගැනීමට ඔහු උදව් කරන්න. එය ශාස්ත්‍රීය අංශයේ ජයග්‍රහණයකට වඩා අතිශය වැදගත් වූ පරමාර්ථයක් ය.

මගේ දියණිය 17 වැනි වියේ පසුවෙද්දී ඇය පාසලට ආදරය කරන්නට පටන් ගත්තා ය. එයට කාරණා දෙකක් හේතු විය. එකක් නම් ඇයට ලැබුණු කලා සම්මානය යි. අනෙක විශ්ව විද්‍යාලයීය කණිෂ්ඨ ඔරු පදින්නගේ කණ්ඩායමට සහභාගී වී වැඩීම තරග ගණනක ජයග්‍රහණ අත්පත් කර ගැනීම යි. ගුරු වෘත්තියට තිබූ මගේ සහජ ලැදියාව අනුව ඇය සියලුම විෂයයන්ගෙන් 'ඒ' සමාර්ථය ලැබුවා නම් එය මගේ අපමණ සතුටට හේතුවන බව නොකිවමනා ය. එහෙත් පියකු වශයෙන් දියණිය කෙරෙහි ඇති ආදරයත්, මගේ සාමාන්‍ය බුද්ධියත් මට කියා සිටියේ චිත්‍ර ඇඳීමෙන් හා ඔරු පැදීමෙන් අත් කර ගත් ජයග්‍රහණයන් ගෙන් ඇය ලැබූ ආත්ම විශ්වාසය අනන්ත අප්‍රමාණ බව ය. එමෙන්ම වැඩි වටිනාකමකින් හා වැදගත්කමකින් යුක්ත බව ය.

අපේ දරුවන් ඉක්මනින් ම අපෙන් සමු ගෙන අපෙන් දුරස්වනු ඇත. ඔවුන්ගේ පාසල් ජීවිත කාලය තුළදී, අප වැඩි වැඩියෙන් ඔවුන්ගේ කටයුතුවලට හවුල් වූ තරමට, ඔවුන් වැඩිහිටියන් ගේ ලෝකයට ඇතුළත්වන විට ඔවුහු වඩාත් නැණවත්හු ය. තෘප්තිමත්හු ය. විශ්වසනීයත්වයෙන් යුක්තහු ය. ❑

රීඩර්ස් ඩයිජස්ට් ඇසුරිනි.

**අනුවාදක**

**එඩ්වින් පතිරණ**